# නත්තල් තෑග්ග



සෙනුජි සහන්සා එදිරිසිංහ

# නත්තල් තෑග්ග

කර්තෘ : සෙනුජි සහන්සා එදිරිසිංහ

චිත්‍ර හා කෘතියේ අයිතිය : සෙනුජි සහන්සා එදිරිසිංහ

**ISBN : 978-624-206-835-0**

දිනය : **2023.11.15**

කර්තෘගේ වෙනත් කෘති : දැහැමිගේ සරුංගලේ (2020)

කුරුළු පැටවු මාරු වෙලා (2023)

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

# පිදුම.............................

මා මේ ලොවට බිහි කර කවා පොවා

උස් මහත් කරනා

මාගේ ආදර අම්මීටත් ,

මා පහනක් සේ රනින් තනා

එම පහන ආරක්ෂා කරනා

මාගේ ආදර අප්පච්චීටත්,

මා සිප් නැණෙන් හා ගුණ නැණෙන් පරිපූර්ණ දියණියක්

කරමින්

මට මෙම පොත ලියන්න හැකි පමණින් උදව් කළ

මාගේ ආදර සමන්මලී ගුරුමෑණියන්ටත්,

හැමවිටම මා ළඟ දැවටෙනා මාගේ චූටි නංගිලා දෙදෙනාටත්

ආදරයෙන් මෙම පොත පුද කරමි.

# ස්තූතිය

මෙම පොත නිර්මාණය කිරීමට

මා හට නන් අයුරින් උදව් උපකාර කළ

සැමදෙනාට

මාගේ හද පිරි ස්තූතිය

පිරිනමමි.

ආයුබෝවන් මම සෙනුජී. එදා දෙසැම්බර් අග විතර අම්මා රෝහලට ගියා. “අනේ අම්මට අසනීපද දන්නෑ” මට බය හිතුණා. අම්මා ගියහම මට ගොඩාරියක් දුක හිතුණා.




දැන් අපේ ගෙදර ගොඩක් පාළු වෙලා. ඇත්තම්මා අපේ උදව්වට ගෙදර නවතින්න ආවා ටික දවසකට. අම්මා ගෙදර නැති නිසා මගේ නංගි සුදූට බොන්න කිරි නැති වුණා.

නංගි සුදුයි මමයි අප්පච්චියි ඇත්තම්මායි, අම්මා එනකන් මග බලන් හිටියා. අම්මා අපට වීඩියෝ කෝල් අරන් කතා කරනවා.

එක දවසක් අප්පච්චි අපට රූපයක් පෙන්නුවා. එතන ලස්සන චූටිම චූටි සුදුයි රතුයි බෝලයක් තිබුණා. “බෝලයක් නෙවෙයි, ඒ බබෙක්” අප්පච්චි එහෙම කිව්වා. “අනේ මටත් තව චූටි නංගි බබෙක් හිටියනම්” කියලා මම හිතුවා.



විනාඩි, පැය, දවස් ගෙවිලා ගියා. නත්තල් දවසත් උදා වුණා. නත්තලට මටත් ලස්සන තෑග්ගක් ලැබෙන්න කියලා මම ප්‍රාර්ථනා කළා.



1 Day
2 Days
3 Days
4 Days
5 Days
6 Days
7 Days
8 Days
Day 9

අපි නත්තලට ලෑස්ති වෙන ගමන් හිටියේ.



ඇප්පච්චි අම්මව එක්කගෙන එන්න රෝහලට ගියා. වාහනේ සද්දේ ඇහුණම මට හරි සතුටු හිතුණා. අම්මා බැස්සේ හිස් අතින් නම් නෙවෙයි. "නත්තල් සීයට මම කරපු ප්‍රාර්ථනාව ඇහිලද කොහෙදෝ" කියලා අම්මා අතේ තෑග්ගක් තිබෙනවා දැක්කම මට හිතුණා. නංගි සුදූටයි මටයි තෑග්ග බලනකම් ඉවසුම් නැති වුණා.



තෑග්ග වෙන මොනවත් නෙවෙයි, මමයි නංගීයි පැතූ චූටිම චූටි නංගි බබා. මට හරි සතුටුයි. “ම්……චූටි හරි සිනිදුයි.මගේ ලොකු නංගි වගේමයි” මට දැන් යාළුවෝ දෙන්නෙක් ඉන්නවා .මේ තමයි මට ලැබුණු හොඳම නත්තල් තෑග්ග.


eLephant



## සෙනුපී සහන්සා එදිරිසිංහ

### පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය භික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මගලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01